ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය,
இலங்கை விமானப்படைத் தலைமயகம்,
SRI LANKA AIR FORCE HEADQUARTERS,

තැ.පෙ. 594, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
த. பெ. 594, பாதுகாப்பு தலைமயக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே, இலங்கை.
P.O. Box 594, Defence Headquarters Complex, Sri Jayewardenepura Kotte, Sri Lanka.

දුරකථනය/ தொலைபேசி / Telephone
පොදු/ பொது/ General 2441044/2495495
සෘජු/ நேரடி/ Direct
දිගුව/ இணைப்பு/ Extension

ෆැක්ස්/ பக்ஸ்/Fax
පොදු/ பொது/ General 2441044/2495495
සෘජු/ நேரடி/ Direct
දිගුව/ இணைப்பு/ Extension

ඊ මේල්/ மின்அஞ்சல்/ e-mail: afhq@airforce.lk
වෙබ් අඩවිය /இணையதளம்/ Website: www.airforce.lk

2026 මැයි මස 05 වන දින

**<u>ත්‍රිකුණාමලය තිරුකෝණේෂ්වර දේවාල පරිශ්‍රයේ රේඩාර් මධ්‍යස්ථානයක් පිහිටුවීමට අදාළව පළ වූ සාවද්‍ය පුවත නිවැරදි කිරීම</u>**

ත්‍රිකුණාමලය තිරුකෝණේෂ්වර දේවාල භූමිය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් රේඩාර් උපකරණ ස්ථාපනය කිරීම සඳහා ඉඩම් ඉල්ලා ඇති බවට පසුගිය දින වල ඇතැම් වෙබ් අඩවි සහ මාධ්‍ය ජාලයන්හි පළ වූ ප්‍රවෘත්තිය කෙරෙහි ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දැඩි අවධානය යොමු වී ඇත. ඒ සඳහා පල කල කළ ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිල ස්ථාවරය සහ කරුණු පැහැදිලි කරන්නෙමු.

තිරුකෝණේෂ්වර දේවාල භූමියේ හෝ ඒ අවට කිසිදු රේඩාර් පද්ධතියක් ස්ථාපනය කිරීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සැලසුම් කර නොමැති අතර, ඒ සඳහා කිසිදු ඉඩම් අත්පත් කර ගැනීමක අවශ්‍යතාවයක්ද නොමැති බව අවධාරණය කරමු.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සැම විටම මෙරට ඓතිහාසික හා ආගමික සිද්ධස්ථානවල පූජනීයත්වයට සහ උරුමයට ගරු කරන ආයතනයකි. එවැනි වැදගත්කමක් සහිත භූමියක සංවර්ධන කටයුතු හෝ හමුදාමය ස්ථාපිතයන් සිදු කිරීමට ගුවන් හමුදාවේ කිසිදු අදහසක් නොමැත.

තවද, කිසිදු නිල සොයා බැලීමකින් තොරව මෙවැනි සාවද්‍ය පුවත් පළ කිරීම මගින් ප්‍රදේශයේ ජනතාව අතර අනවශ්‍ය නොසන්සුන්තාවයක් සහ ගුවන් හමුදාව කෙරෙහි වැරදි ආකල්පයක් ඇති වීමට ඉඩ පවතී.

එබැවින්, මෙම පුවත සාවද්‍ය පුවතක් බව වැඩි දුරටත් කාරුණිකව දන්වා සිටුමු.

**මාධ්‍ය අධ්‍යක්ෂක**
**ගුවන් හමුදා මාධ්‍ය ඒකකය**